WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

ඉස්ලාම්	I, II
இஸ்லாம்	I, II
Islam	I, II

ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. කෙටි පිළිතුරු සපයන්න.

(i) සුබහු සලාතයට පසුව 'කලිමතුත් තව්හීද්' පාරායනය කරන අයෙකුට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(ii) මිඃරාජ් ගමනින් පසුව ජිබ්රීල් (අලෛ) තුමා ඉමාම්වරයෙකු ලෙස කටයුතු කරමින් මුහම්මද් (සල්) තුමාණන්ට කොපමණ දවසක් සලාතය ඉගැන්නුවේ ද?

(iii) කලීෆා උමර් (රලි) තුමාගේ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දෙන ලදැයි, යන උපකල්පනයට පදනම් වූ ඉතිහාසඥවරයා කවුරුන් ද? ඔහු ලියූ ග්‍රන්ථය කුමක් ද?

(iv) "ඖජ් වාජිබ් වූ, මරණයට පත් වූ පියා වෙනුවෙන් අපට හජ් කළ හැකි යැයි" පැවසූ නබි (සල්) තුමාණන්, එය කුමන ක්‍රියාව සමඟ සසඳා පැහැදිලි කළේ ද?

(v) කෘෂිකර්මාන්තයේ යෙදීම සහ ඒ වෙනුවෙන් පොළොව සාරවත් කිරීම යන ක්‍රියාවන් අවධාරණය කොට නබි (සල්) තුමාණන් පැවසූ උපදෙස්වලින් **එකක්** සඳහන් කරන්න.

(vi) සලාතයේ සුපූර්ණ කිරීමේ දී පොළොව ස්පර්ශ කළ යුතු අවයව ගණන කීයද?

(vii) ප්‍රධාන මද්හබ් **දෙකක්** නම් කර, ඒවායේ නිර්මාතෘවරුන් සඳහන් කරන්න.

(viii) 'උම්මත්' යන පදයෙහි තේරුම භාෂාමය හා සමාජීය දෘෂ්ටිකෝණයෙන් ලියා දක්වන්න.

(ix) අල්කුර්ආනයේ සාහිත්‍යමය විශිෂ්ටත්වය ඉදිරියේ තම නොහැකියාව පිළිඉත්, එවකට ඉස්ලාමයට එරෙහිව සිටි කවියන් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(x) "සැක නැති දේ පිළිපදින්න" යනුවෙන් පැවසූ නබි (සල්) තුමාණන් සැකයට මඟපාදන දෑ කෙසේ හැසිරවීමට උපදෙස් ලබා දුන්නේ ද?

WWW.OLEVELAPI.COM

2. (i) දේශපාලන අරමුණකින් තොරව, අකීදාව පදනම් කරගෙන බිහි වූ දාර්ශනික කොටස් **දෙකක්** සඳහන් කරන්න.

(ii) අනෙකුත් නබිවරුන්ට වඩා මුහම්මද් (සල්) තුමාණන්ට පමණක් ලබාදෙන ලද සුවිශේෂී ගුණාංග **හය** සඳහන් කරන්න.

(iii) ජීවිතයේ මධ්‍යස්ථභාවය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරන නබි (සල්) තුමාණන්ගේ දිවියේ සිදුවීමක් පැහැදිලි කරන්න.

3. (i) එක් පුද්ගලයෙකුට විවාහවීම සඳහා තාවකාලිකව තහනම් කරන ලද **දෙදෙනෙකු** සඳහන් කරන්න.

(ii) ඉස්ලාමීය දෘෂ්ටියට අනුව විවාහයේ අරමුණු **තුනක්** සඳහන් කරන්න.

(iii) 'ඉද්දා' යනු කුමක් දැයි සඳහන් කර, කාන්තාවක් එය ඉටුකිරීමෙන් ලබන ප්‍රතිලාභ **තුනක්** පිළිබඳ විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

4. (i) රමලාන් මස 'ෆර්ල්' යන අනිවාර්ය උපවාසය අතහැර වෙනත් දිනවල උපවාසය ඉටුකිරීමට සහනයක් ලබාදුන් **දෙපිරිස** සඳහන් කරන්න.

(ii) හජ් හා උම්රා ඉටු කිරීමේ දී තහනම් කරන ලද ක්‍රියාවන් **තුනක්** සඳහන් කරන්න.

(iii) අබූබකර් (රලි) කලීෆා ධූරයට පත් වූ පසුව ඔහු විසින් ඉටුකරන ලද සේවාවන් **පහක්** පැහැදිලි කරන්න.

5. (i) දයාව දැක්වීම යන ගුණාංගය හා සම්බන්ධ අල්ලාහ්ගේ නාමයන් **දෙකක්** සඳහන් කරන්න.

(ii) කෙනෙක් තවත් කෙනෙකු කෙරෙහි දයාව දැක්වීමෙන් ලබාගන්නා වූ ප්‍රතිලාභ **තුනක්** සඳහන් කරන්න.

(iii) උම්මත් යන ව්‍යුහය ආරක්ෂා කිරීමට අල්කුර්ආනය හා සුන්නාව ලබා දී ඇති මගපෙන්වීම් **පහක්** සඳහන් කරන්න.

6. (i) එතෙක් කල් මක්කමේ තම දෑවාවට සහයෝගය ලබා දී, එකම වර්ෂයේ මරණයට පත් වූ නිසා නබි (සල්) තුමාණන් දැඩි ලෙස කම්පනයට ලක්කළ **දෙදෙනා** කවුරුන් ද?

(ii) නබි (සල්) තුමාණන්ගේ ආගමික දේශනය නවතාලීමට කුරෙෂිවරුන් විසින් හසුරුවන ලද ක්‍රියාදාමයන් **තුනක්** සඳහන් කරන්න.

(iii) 'සීරත් රසූලුල්ලාහ්' ආරක්ෂා කිරීම සඳහා මුල් කාල වකවානුවල කරන ලද ඇතැම් ගවේෂණාත්මක උත්සාහයන් **තුනක්** පිළිබඳ පැහැදිලි කරන්න.

7. පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක්** ගැන කෙටි සටහන් ලියන්න.

(i) පවිත්‍රතාවයේ වැදගත්කම

(ii) වෙළෙඳාමේ බඩු භාණ්ඩ සැඟවීම

(iii) මස්ජිදුන් නබවී

(iv) පාරිසරික සාරධර්ම පිළිපැදීම

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...